# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2195/9 – 2020 සැප්තැම්බර් 28 වැනි සඳුදා – 2020.09.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2016 අගෝස්තු මස 25 වැනි දින අංක 1981/84 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි (460 වැනි අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පල කරන ලද 2016 අංක 181 දරන ආඥාවේ ඇතුළත් ඉඩම් කොටස් සම්පූර්ණයෙන්ම රජය සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස් වල සන්තකය ද ලබා ගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුලත් කරන ලද) 39අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම එකී ඉඩම් කොටස් අතුරින් පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/7/2016/HW/57.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: BK/LAN/AQURE/A3/69.
2020 සැප්තැම්බර් මස 12 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
අංක 1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිණිගොඩ කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 3ජී, කොටවැල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ කොටවැල්ල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අ.ග.පි. 142 අතිරේක 4 පත්‍ර අංක 4 හා 2017.06.29 දිනැති අවසාන ගම් පිඹුරේ පහත සඳහන් මායිම් තුළ වූ කොටස්.

01. කැබලි අංක 360 – **සියඹලාගහමුලවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0035**

උතුරට: කැබලි අංක 357 හා 358; නැගෙනහිරට: කැබලි අංක 361; දකුණට: කැබලි අංක114; බටහිරට: කැබලි අංක 114, 359 හා 356.

02. කැබලි අංක 363 – **අඹකොටේකුඹුර නොහොත් කුඹුක්ගහමුලකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0002**

උතුරට: කැබලි අංක 342 හා 341; නැගෙනහිරට: කැබලි අංක 341; දකුණට: කැබලි අංක118; බටහිරට: කැබලි අංක 138 හා 362.

10 - 466



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*